

# දිව්‍ය පූජා පිළිවෙත

අති ශුද්ධවූ දෙවන වතිකාන සභාසාංඝික සමුළුවේ නියමයෙන් නවමු බව ලැබ,
සාන්ත හයවන පාවුළු සසුනිසුරාණන් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ,
සහ සාන්ත දෙවන ජුවාම් පාවුළු සසුනිසුරාණන්ගේ අනුශාසකත්වයෙන් සංස්කරණය කරන ලද,
තෙවන (ලතින්) ආකෘතික සංස්කරණයට අනුව සිදු කරන ලද සිංහල පරිවර්තනය යි.

ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු වසම් තුළ භාවිතය සඳහා
ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර
ශුද්ධාසනයේ දේව වන්දනා සංසදය මගින් ද ස්ථිර කරන ලදී


ශ්‍රී ලංකාවේ දේව වන්දනා සහ සංස්කෘතිය පිළිබඳ
ජාතික කොමිසම මගින් ප්‍රකාශයට පත් කරන ලද සංස්කරණයකි
කොළඹ, ශ්‍රී ලංකාව, 2025

මුද්‍රණ අවසරය

✠ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
සභාපති, ජාතික දේව වන්දනා කොමිසම.
ලංකාරාමය,
අංක 19, බැල්කම් පෙදෙස,
කොටා පාර, කොළඹ 08.
2025

සියලු හිමිකම් ඇවිරිණි
ශ්‍රී ලංකාවේ දේව වන්දනා සහ සංස්කෘතිය පිළිබඳ ජාතික කොමිසමේ
ලිඛිත අවසරයක් නොමැතිව මෙහි පළවන කිසිදු කොටසක් උපුටා ගැනීම,
මුද්‍රණය කිරීම හෝ අන් අයුරින් පළ කිරීම තහනම් වේ.

---

මුද්‍රණය

කොළඹ කතෝලික මුද්‍රණාලය
අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත
බොරැල්ල, කොළඹ 08

# පෙරවදන

Missale Romanum හෙවත් රෝමානු දිව්‍ය පූජා සංග්‍රහයේ තෙවන සංස්කරණයෙහි අඩංගු දිව්‍ය පූජා පිළිවෙතෙහි සිංහල පරිවර්තනය මෙසේ එළිදක්වන්නට ලැබීම සතුටට කරුණකි.


අප සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වකීය ශ්‍රී ශරීරයේ සහ ශ්‍රී රුධිරයේ යාගය, ස්ථාපිත කරන ලද පාස්කු භෝජන සංග්‍රහය පැවැත්වීමට පෙරාතුව, ඒ සඳහා සුදුසු ස්ථානයක් සූදානම් කරන ලෙස ස්වකීය ශ්‍රාවකයින්ට උපදෙස් දුන් සේක (ලූක් 22: 12). සුවිශුද්ධ එම දිව්‍ය පූජා යාගය සැමරීම සඳහා සැදැහැවත් හදවත් සහ මනස ද, එය පවත්වනු ලබන ස්ථානය ද, පිළිවෙත් සහ ඒ සඳහා අවශ්‍ය යාච්ඤා ආදී සියල්ල සූදානම් කිරීම සඳහා උපදෙස් ලබා දීමේ දී සාන්ත සභාව ද සමිඳාණන් වහන්සේගේ ඉහත කී ආඥාව තමන්ටද අදාළ දෙයකැයි සලකා එම සම්ප්‍රදායයන් විශ්වාසනීයව පිළිපදින්නීය.

දිව්‍ය පූජාව සැමරීමේ දී භාවිතා කිරීමට නියමිත මෙම දිව්‍ය පූජා සංග්‍රහය වනාහී, දිව්‍ය පූජා යාගයේ සුවිසල් අභිරහස කෙරෙහි සාන්ත සභාව සතු සරුසාර ඇදහිල්ල සහ ඒ සඳහා වන ගැඹුරු ප්‍රේමය පිළිබඳ ප්‍රබල සාක්ෂියකි.

රෝමානු දිව්‍ය පූජා සංග්‍රහයේ පළමු සංස්කරණය 1970 දී ද දෙවන සංස්කරණය 1975 දී ද ප්‍රකාශයට පත් වූ අතර, තෙවැනි සංස්කරණය ප්‍රකාශයට පත් වූයේ 2000 වසරේ දීය. සමස්ත දිව්‍ය පූජා සංග්‍රහය පොත් භාණ්ඩ පහකින් සමන්විත වන අතර, මෙසේ ඔබ අතට පත්වන්නේ මෙහි අඩංගු වන දිව්‍ය පූජා පිළිවෙතෙහි සිංහල පරිවර්තනයයි.

මෙම පරිවර්තනය 2024 අප්‍රියෙල් සිට ඔක්තෝබර් දක්වා වූ මාස හතක කාලයක් පුරා අත්හදා බැලීමට හෙවත් පරික්ෂණයට ලක් කිරීම සඳහා අපගේ දේවස්ථානයන්හි භාවිතයට ගැනිණි. ඒ කාල පරිච්ඡේදයේ දී ලද යෝජනා, අදහස්, සංශෝධන සහ නිරීක්ෂණ ආදිය ද ඉතා ප්‍රවේසමෙන් සලකා බැලීමෙන් අනතුරුව මෙම අවසාන සිංහල පරිවර්තනය සැකසිණි. අපගේ දේවස්ථානයන්හි පවත්වනු ලබන දිව්‍ය පූජා යාගයන්හි දී මෙය භාවිතා කිරීම සඳහා අවශ්‍ය නිල අවසරය, දේව වන්දනාව සහ ප්‍රසාද නිධානයන්හි විනය පිළිබඳ ශුද්ධාසනීය සංසදය විසින් Prot -460/24 නමැති යොමු අංකය යටතේ ලබා දී තිබේ.

රෝමානු දිව්‍ය පූජා සංග්‍රහයේ තෙවන සංස්කරණයේ අඩංගු දිව්‍ය පූජා පිළිවෙතෙහි මෙම සිංහල පරිවර්තනය, ශුද්ධවූ කුරුසියේ මහිමය සමරනු ලබන මංගල්‍යය පැවැත්වෙන 2025 සැප්තැම්බර් 14 දින සිට, ශ්‍රී ලංකාවේ සියලු රදගුරු පදවි තුළ භාවිතයට ගත යුතුය. මෙම දිනයෙන් පසු, රෝමානු දිව්‍ය පූජා සංග්‍රහයේ වෙනත් කිසිදු සිංහල පරිවර්තනයක් ශ්‍රී ලංකාව තුළ භාවිතයට නොගත යුතු බවද මෙහි ලා අවධාරණය කරමු.



අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
සභාපති, ජාතික දේව වන්දනා කොමිසම.
ලංකාරාමය,
අංක 19, බැල්කම් පෙදෙස,
කොටා පාර, කොළඹ 08.

31.08.2025

# පටුන


## දිව්‍ය පූජා පිළිවෙත

පිවිසුම් පිළිවෙත . . . . . 3
දේව වචනයේ පිළිවෙත . . . . . 8
ස්තෝත්‍ර යාගික පිළිවෙත . . . . . 12
ප්‍රශංසා පෙරවදන් . . . . . 17
ස්තෝත්‍ර යාගික යැදුම් . . . . . 69
ස්තෝත්‍ර යාගික යැදුම - I . . . . . 71
ස්තෝත්‍ර යාගික යැදුම - II . . . . . 79
ස්තෝත්‍ර යාගික යැදුම - III . . . . . 84
ස්තෝත්‍ර යාගික යැදුම - IV . . . . . 89
දිව බොදුන් පිළිවෙත . . . . . 94
සමාප්ත පිළිවෙත . . . . . 97

## ප්‍රශංසා පෙරවදන්

ආගමන සමය සඳහා ප්‍රශංසා පෙරවදන් - (I-II) . . . . . 17
කිතු උපත අරබයා ප්‍රශංසා පෙරවදන් - (I- III) . . . . . 19
සමිඳුණන් ලොවට ප්‍රත්‍යක්ෂ වීම අරබයා ප්‍රශංසා පෙරවදන . . . . . 22
චතාරික සමය සඳහා ප්‍රශංසා පෙරවදන් - (I-IV) . . . . . 23
සමිඳුණන්ගේ දුඃඛප්‍රාප්තිය අරබයා ප්‍රශංසා පෙරවදන් - (I-II) . . . . . 27
උත්ථාන සමය සඳහා ප්‍රශංසා පෙරවදන් - (I-V) . . . . . 29
සමිඳුණන්ගේ ස්වර්ගාරෝහණය අරබයා ප්‍රශංසා පෙරවදන් - (I-II) . . 34
වසරේ සාමාන්‍ය ඉරුදිනයන් සඳහා ප්‍රශංසා පෙරවදන් - (I-VIII) . . . 36
දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අරබයා ප්‍රශංසා පෙරවදන් - (I-II) . . . . . 44
භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් අරබයා පෙරවදන් - (I-II) . . . . . 46
අපෝස්තුළුවරුන් අරබයා ප්‍රශංසා පෙරවදන් - (I-II) . . . . . 48
ශුද්ධවරයන්, ශුද්ධවරියන් අරබයා ප්‍රශංසා පෙරවදන් - (I-II) . . . . . 50
ප්‍රාණ පරිත්‍යාගීන් අරබයා ප්‍රශංසා පෙරවදන් - (I-II) . . . . . 52
සභා එඬේරුන් අරබයා ප්‍රශංසා පෙරවදන . . . . . 54
ශු. කන්‍යාවන් හා ශු. පැවිදිවරියන් අරබයා ප්‍රශංසා පෙරවදන . . . . . 55
පොදු ප්‍රශංසා පෙරවදන් - (I-VI) . . . . . 56
මළවුන් අරබයා ප්‍රශංසා පෙරවදන් - (I-V) . . . . . 62
නිදහස් දින හා වෙනත් සිවිල් උත්සව අවස්ථා අරබයා ප්‍රශංසා පෙරවදන 67
තුති දීමේ අවස්ථාවන් අරබයා ප්‍රශංසා පෙරවදන . . . . . 68

# දිව්‍ය පූජා පිළිවෙත

# පිවිසුම් පිළිවෙත

1. සැදැහැවතුන් රැස් වූ විට පූජාප්‍රසාදිතුමා තේවාධරයන් සමග පූජාසනය කරා පැමිණේ. ඒ අතර පිවිසුම් ගීතිකාව ගයනු ලැබේ.

පූජාප්‍රසාදිතුමා තේවාධරයන් කැටුව පූජාසනය ඉදිරියට පැමිණ ඔවුන් සමග පූජාසනයට ගැඹුරින් වැඳ නමස්කාර කරයි. ඉන් පසුව එතුමා පූජාසනය සිපාචාර කරයි. ඒ ඒ පිළිවෙතට උචිත වේ නම් කුරුසියට හා පූජාසනයට සුවඳ දුම් පුදයි. ඉන් පසුව එතුමා තේවාධරයන් සමග මූලාසනය කරා පා නගයි. පිවිසීමේ ගීතිකාව නිම වීමත් සමග පූජාප්‍රසාදිතුමා සැදැහැවතුන් සමග ශ්‍රී කුරුසියේ ලකුණ තමා මත සලකුණු කර ගනිමින් මෙසේ කියයි.

**පියාණන් වහන්සේගේ ද පුත්‍රයාණන් වහන්සේගේ ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන්.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**ආමෙන්.**

2. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපසට විහිදා, සැදැහැවතුන්ට මෙසේ ආචාර කරයි.

**අප සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදයත්, දෙවි පියාණන් වහන්සේගේ ප්‍රේමයත්, ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහභාගිකමත්, ඔබ සියල්ලන් සමග පවතීවා.**

හෝ:

**අප පියාණන් වන දෙවියන් වහන්සේගෙන් සහ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගෙන් ලැබෙන සාමයත් වරප්‍රසාදයත් ඔබ සමග පවතීවා.**

හෝ:

**සමිඳාණන් වහන්සේ ඔබ සමග වන සේක්වා.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**ඔබ සමග ද වන සේක්වා.**

---

ඉහත ආචාරයේ දී, රදගුරුතුමකු නම්, ''සමිඳාණන් වහන්සේ ඔබ සමග වන සේක්වා'' වෙනුවට

**ඔබට සාමය වේවා**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**ඔබ සමග ද වන සේක්වා.**

---

3. පූජාප්‍රසාදිතුමා/තේවාචාර්යතුමා හෝ අන් සුදුසු සහයකයෙක් එදින දිව්‍ය පූජා පිළිවෙත ලුහුඬින් හඳුන්වා දෙයි.

## පශ්චාත්තාප වීම

4. අනතුරුව පශ්චාත්තාපවීම සිදු කෙරේ. පූජාප්‍රසාදීතුමා මෙසේ කියමින්, සැදැහැවතුන් පශ්චාත්තාපයට ඇරයුම් කරයි.

**සහෝදර සහෝදරියනි, මෙම දිව්‍ය අභිරහස් පිළිවෙත සිදුකිරීමට අප සුදුස්සන් වන පිණිස, අපි අපගේ පව් පිළිගනිමු.**

සුළු මොහොතක් නිශ්ශබ්දව සිට, සියල්ලෝ පොදු පාපෝච්චාරණ ආරාධනාව හෝ පහත සඳහන් එක් ක්‍රමයක් භාවිත කරති.

**සර්වබලධාරි දෙවියන් වහන්සේට ද සහෝදර සහෝදරියනි ඔබට ද මා පව් කළ බව කියමි. සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් සහ අතපසු කිරීමෙන් මම බොහෝ සේ පව් කෙළෙමි.**

ළයට ගසා ගනිමින් මෙසේ කියති.

**ඒ මාගේ වරදින් ය, මාගේ වරදින් ය, මාගේ මහත් වරදින් ය.**

ඉන් පසු මෙසේ කියති.

**එහෙයින් භාග්‍යවන්ත නිත්‍ය කන්‍ය මරියතුමියගෙන් ද සියලු සුරදූතයන්ගෙන් හා ශුද්ධවන්තයන්ගෙන් ද මාගේ සහෝදර සහෝදරියනි ඔබගෙන් ද මා උදෙසා, අපගේ සමිඳාණන් වන දෙවියන් වහන්සේට යාච්ඤා කරන මෙන් අවනතව ඉල්ලා සිටිමි.**

පසුව පූජාප්‍රසාදීතුමා පහත සඳහන් පව් කමාව අයදියි.

**සර්වබලධාරි දෙවියන් වහන්සේ අපට කරුණාකර, අපගේ පව් කමා කර, සදා ජීවනයට අප පමුණුවන සේක්වා.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**ආමෙන්.**

හෝ

5. පූජාප්‍රසාදිතුමා පශ්චාත්තාප වීම සඳහා සැදැහැවතුන්ට ආරාධනා කරයි.

**සහෝදර සහෝදරියනි, මෙම දිව්‍ය අභිරහස් පිළිවෙත සිදුකිරීමට අප සුදුස්සන් වන පිණිස, අපි අපගේ පව් පිළිගනිමු.**

සුළු මොහොතක නිශ්ශබ්දතාවකින් පසු පූජාප්‍රසාදීතුමා මෙසේ කියයි.

**අහෝ සමිඳුණනි, අපට කරුණා කළ මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

මක්නිසාදයත්, අප ඔබ වහන්සේට විරුද්ධව පව් කළ බැවිනි.

පූජාප්‍රසාදිතුමා

**අහෝ සමිඳුණනි, අපට ඔබ වහන්සේගේ කරුණාව පෙන්නුව මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

ඔබ වහන්සේගේ ගැලවීම අපට දානය කළ මැනව.

පසුව පූජාප්‍රසාදිතුමා පහත සඳහන් පොදු පව් කමාව අයදියි.

**සර්වබලධාරී දෙවියන් වහන්සේ අපට කරුණාකර, අපගේ පව් කමා කර, සදා ජීවනයට අප පමුණුවන සේක්වා**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

ආමෙන්.

---

හෝ

6. පූජාප්‍රසාදිතුමා පශ්චාත්තාප වීම සඳහා සැදැහැවතුන්ට ආරාධනා කරයි.

**සහෝදර සහෝදරියනි, මෙම දිව්‍ය අභිරහස් පිළිවෙත සිදුකිරීමට අප සුදුස්සන් වන පිණිස, අපි අපගේ පව් පිළිගනිමු.**

සුළු මොහොතක නිශ්ශබ්දතාවකින් පසු පූජාප්‍රසාදීතුමා මෙසේ කියයි.

**සිත් තැවුල් වූවන් සුවපත් කිරීම සඳහා එවනු ලැබූ,
සමිඳුණනි, කරුණා කළ මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

සමිඳුණනි, කරුණා කළ මැනව.

පූජාප්‍රසාදිතුමා

**පව්කරුවන් කැඳවා ගැනීම සඳහා වැඩම කළ,
ක්‍රිස්තුනි, කරුණා කළ මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

ක්‍රිස්තුනි, කරුණා කළ මැනව.

පූජාප්‍රසාදිතුමා

**පියාණන් වහන්සේගේ දකුණු පසෙහි වැඩ සිටිමින්,
අප වෙනුවෙන් මැදහත් වන, සමිඳුණනි, කරුණා කළ මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**සමිඳුණනි, කරුණා කළ මැනව.**

පූජාප්‍රසාදිතුමා

**සර්වබලධාරි දෙවියන් වහන්සේ අපට කරුණාකර, අපගේ පව් කමා කර, සදා ජීවනයට අප පමුණුවන සේක්වා**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**ආමෙන්.**

---

7. සමිඳුණනි කරුණා කළ මැනව, ඉහතදි භාවිත නොවිනි නම්, එය මෙහි දී උච්චාරණය /ගායනය කරනු ලැබේ.

පූජාප්‍රසාදිතුමා

**සමිඳුණනි, කරුණා කළ මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**සමිඳුණනි, කරුණා කළ මැනව.**

පූජාප්‍රසාදිතුමා

**ක්‍රිස්තුනි, කරුණා කළ මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**ක්‍රිස්තුනි, කරුණා කළ මැනව.**

පූජාප්‍රසාදිතුමා

**සමිඳුණනි, කරුණා කළ මැනව.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**සමිඳුණනි, කරුණා කළ මැනව.**

# මහිම ගීතිකාව

8. නිර්දේශිත අවස්ථාවලදී ගායනය කරනු ලැබේ, නැතහොත් උච්චාරණය කරනු ලැබේ.

අති උත්කෘෂ්ට මණ්ඩලයෙහි දෙවියන් වහන්සේට මහිමය ද
මිහිපිට සුසිත් දනන් හට සාමය ද වේවා.

දෙවි සමිඳුණනි, ස්වර්ගීය රජාණනි, සර්වබලධාරී දෙවි පියාණනි,
අපි ඔබ වහන්සේට ප්‍රශංසා කරමු,
ඔබ වහන්සේගේ ගුණ වර්ණනා කරමු,
ඔබ වහන්සේට වන්දනා කරමු, ඔබ වහන්සේගේ මහිමය පළ කරමු,
ඔබ වහන්සේගේ අති මහත් මහිමය නිසා
අපි ඔබ වහන්සේට තුති පුදමු.

ඒක ජනිත පුත්‍රවූ ජේසු ක්‍රිස්තුනි,
දෙවි සමිඳුණනි, දේව බැටළුපෝතකයාණනි,
පියාණන් වහන්සේගේ පුත්‍රයාණනි,
ලොවේ පව් හරන ඔබ වහන්සේ, අපට කරුණා කළ මැනව.
ලොවේ පව් හරන ඔබ වහන්සේ, අපගේ යැදුම පිළිගත මැනව.
පියාණන්ගේ දකුණු පසෙහි වැඩ සිටින ඔබ වහන්සේ,
අපට කරුණා කළ මැනව.

මක්නිසාදයත්,
ශුද්ධාත්මයාණන් වහන්සේ සමග
දෙවි පියාණන් වහන්සේගේ මහිමයෙහි
එක්ව වැඩ වසන්නාවූ ජේසු ක්‍රිස්තුනි,
එකම ශුද්ධ වූ තැනැන් වහන්සේ ඔබ වහන්සේම ය,
එකම සමිඳුණන් වහන්සේ ඔබ වහන්සේම ය,
එකම අති උත්කෘෂ්ට තැනැන් වහන්සේ ඔබ වහන්සේ ම ය.
ආමෙන්.

9. මේ ගීතිකාව නිම වූ විට පූජාප්‍රසාදිතුමා දෙ අත් වැඳගෙන මෙසේ කියයි.

අපි යාච්ඤා කරමු.

පූජාප්‍රසාදිතුමා ඇතුළු සියල්ලෝ සුළු මොහොතක් නිහඬව යාච්ඤා කරති. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපසට විහිදාගෙන සංග්‍රහණ යැදුම උච්චාරණය කරයි. ඒ අවසානයේ දී සැදැහැවත්හු උද්දාමයෙන් මෙසේ පිළිතුරු දෙති.

ආමෙන්.

# දේව වචනයේ පිළිවෙත

10. ඉන් පසු දේව වචනය ප්‍රකාශකරන තේවාධරයා ප්‍රකාශනාසනය වෙත ගොස්, පළමු ප්‍රකාශනය ඉදිරිපත් කරයි. ඒ අතර සියල්ලෝ අසුන් ගෙන සවන් දෙති. ප්‍රකාශනය අවසානයේ දී තේවාධරයා මෙසේ කියයි.

දෙවියන් වහන්සේගේ ශ්‍රී වචනයයි.

සියල්ලෝ පිළිතුරු දෙති.

දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

11. තෙහිලි සජ්ඣායකයා පිළිතුරු තෙහෙලි ගීය සජ්ඣායනා කරයි. සැදැහැවතුහු ඊට පිළිතුර දෙති.

12. ඉන් පසු, දෙවන ප්‍රකාශනයක් තිබේ නම්, තේවාධරයා ප්‍රකාශනාසනයේ සිට එය ප්‍රකාශ කරයි. එය අවසානයේ දී තේවාධරයා මෙසේ කියයි.

දෙවියන් වහන්සේගේ ශ්‍රී වචනයයි.

සියල්ලෝ පිළිතුරු දෙති.

දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

13. ඉන් පසු සුපුවත් ජය නද හෝ දේව වන්දනා වසරට උචිත වෙනත් පදයක් සජ්ඣායනා කරනු ලැබේ.

14. මේ අතර, සුවඳ දුම් භාවිත කරන අවස්ථාවක දී නම්, පූජාප්‍රසාදිතුමා දුම් බඳුනට සුවඳ ලාටු දමයි. ඉන් පසු ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී සුබාරංචිය ප්‍රකාශ කරන තේවාචාර්යවරයා, පූජාප්‍රසාදිතුමන් ඉදිරියේ හිස නමා, පහත් හඬින් මෙසේ කියමින් ආශීර්වාදය පතයි.

පියාණනි, මා ආශීර්වාද කළ මැනව.

පූජාප්‍රසාදිතුමා, පහත් හඬින් මෙසේ කියයි.

**ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී සුබාරංචිය යෝග්‍ය ලෙස ද බලාන්විතව ද ප්‍රකාශ කරන්නට ඔබට හැකි වන පිණිස, ඔබගේ හෘදයෙහි ද දෙතොලෙහි ද සමිඳුණෝ වැඩ සිටින සේක්වා, පියාණන් වහන්සේගේ ද පුත්‍රයාණන් වහන්සේගේ ද ✠ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන්.**

තේවාචාර්යවරයා කුරුසියේ ලකුණින් තමා ම, සලකුණු කර ගනිමින්, මෙසේ පිළිතුරු දෙයි.

ආමෙන්.

තේවාචාර්යවරයකු නැති විට, පූජාප්‍රසාදිතුමා පූජාසනය ඉදිරියේ හිස නමා පහත් හඬින් මෙසේ කියයි.

**සර්වබලධාරී දෙවිඳාණනි, ඔබ වහන්සේගේ ශ්‍රී සුබාරංචිය යෝග්‍ය ලෙස ප්‍රකාශ කරන්නට මට හැකි වන පිණිස, මාගේ හෘදය ද මාගේ දෙතොල ද පවිත්‍ර කළ මැනව.**

15. ඉන් පසු තේවාචාර්යවරයා හෝ පූජාප්‍රසාදිතුමා හෝ ප්‍රකාශනාසනය වෙත යයි. අවස්ථානුකූලව සහයකයෝ එතුමන් සමග සුවඳ දුම් ද පහන් ද රැගෙන යති. පූජාප්‍රසාදිතුමා හෝ තේවාචාර්වරයා හෝ මෙසේ කියයි.

**සමිඳාණන් වහන්සේ ඔබ සමග වන සේක්වා.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**ඔබ සමග ද වන සේක්වා.**

තේවාචාර්යවරයා හෝ පූජාප්‍රසාදිතුමා

**සුවිශේෂක............... විසින් ලියන ලද ශුද්ධ වූ සුවිශේෂයෙන් කොටසකි.**

කියන විට ශ්‍රී සුබාරංචි සංග්‍රහය මත ද තම නළල, දෙතොල සහ පපුව මතද, කුරුසියේ ලකුණ සලකුණු කර ගනියි. ඒ අතර සැදැහැවත්හුද, එසේම ලකුණු කර ගනිමින් මෙසේ කියති.

**සමිඳාණනි, ඔබ වහන්සේට මහිමය වේවා.**

ඉන් පසු තේවාචාර්යවරයා හෝ පූජාප්‍රසාදිතුමා හෝ (සුවඳ දුම් භාවිත කරන අවස්ථාවක දී නම්) ශ්‍රී සුබාරංචි සංග්‍රහයට සුවඳ දුම් පුදා ශ්‍රී සුබාරංචිය ප්‍රකාශ කරයි.

16. ශ්‍රී සුබාරංචි ප්‍රකාශනය අවසානයේ දී තේවාචාර්යතුමා හෝ පූජාප්‍රසාදිතුමා හෝ මෙසේ කියයි.

**සමිඳාණන් වහන්සේගේ ශ්‍රී සුබාරංචියයි.**

සියල්ලෝ පිළිතුරු දෙති.

**ක්‍රිස්තුනි, ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.**

ශ්‍රී සුබාරංචි සංග්‍රහය සිපාචාර කරමින්, තේවාචාර්යවරයා හෝ පූජාප්‍රසාදිතුමා හෝ පහත් හඬින් මෙසේ කියයි.

**ශ්‍රී සුබාරංචියේ වචනය මගින් අපගේ පව් මැකේවා.**

17. ඉන් පසු පූජාප්‍රසාදිතුමා හෝ තේවාචාර්යවරයා හෝ ධර්ම දේශනාව පවත්වයි. ඉරුදිනවල ද ණය මංගල දිනවල ද එය පැවැත්වීම අනිවාර්ය වේ. සෙසු දිනවල ද කෙටි දේශනාවක් පැවැත්වීම උචිත ය.

18. දේශනාවෙන් පසුව, නිර්දේශිත දිනවල විශ්වාස ලක්ෂණය උච්චාරණය කරනු ලැබේ.

**එකම දෙවියන් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි.**
**අහස හා පොළොව ද පෙනෙන නොපෙනෙන සියල්ල ද මවා වදාළ**
**සර්වබලධාරි පියාණන් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි.**

**එකම සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි**
**මම විශ්වාස කරමි.**
**උන් වහන්සේ සැම කලටම පෙර**
**පියාණන් වහන්සේගෙන් ජනිත වූ සේක.**
**උන් වහන්සේ දෙවිඳාණන්ගෙන් දෙවිඳාණෝ ද**
**ආලෝකයෙන් ආලෝකය ද**
**සැබෑ දෙවිඳාණන්ගෙන් සැබෑ දෙවිඳාණෝ ද වන සේක.**
**ජනිත වූ නමුත්, මවනු නොලැබ,**

පියාණන් වහන්සේ සමග සමභවත්වයෙන් යුතුව
උන් වහන්සේ වැඩ සිටින සේක.
උන් වහන්සේ මගින් සියල්ල මවන ලද්දේ ය.
මිනිස් අප උදෙසා ද අපගේ ගැලවීම උදෙසා ද
උන් වහන්සේ ස්වර්ගයෙන් බැස වදාළ සේක.

පහත වගන්තියේ "මනුෂ්‍යයා වූ සේක" යන්න දක්වා සියල්ලෝම හිස නමති.

තවද ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙන්
කන්‍යා මරියාවන්ගෙන් මාංශ ගත වී,
උන් වහන්සේ මනුෂ්‍යයා වූ සේක.
උන් වහන්සේ අප උදෙසා,
පොන්සියු පිලාත් යටතේ කුරුසියේ ඇණගසනු ලැබ,
මරණ වේදනා විඳ උකුත් වී, තැන්පත් කරනු ලැබූ සේක.
ශුද්ධ ලියවිලි පරිදි, උන් වහන්සේ තුන්වන දා උත්ථාන වූ සේක.
උන් වහන්සේ ස්වර්ගාරෝහණව,
පියාණන් වහන්සේගේ දකුණු පසෙහි වැඩ සිටින සේක.
ජීවතුන් ද මළවුන් ද විනිශ්චය කරන පිණිස,
උන් වහන්සේ මහිමාන්විතව නැවත වඩින සේක.
උන් වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නොමැත්තේ ය.

සමිඳාණන් ද ජීවදායකයාණන් ද වන
ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි ද මම විශ්වාස කරමි.
පියාණන් වහන්සේගෙන් හා
පුත්‍රයාණන් වහන්සේගෙන් නික්මෙන උන් වහන්සේ,
පියාණන් වහන්සේ හා පුත්‍රයාණන් වහන්සේ සමග
එකම වන්දනාවත් මහිමයත් ලබන සේක.
උන් වහන්සේ දිවැසිවරුන් මගින් කථා කළ සේක.

එකම වූ ද ශුද්ධ වූ ද කතෝලික වූ ද අපෝස්තලික වූ ද
සභාව කෙරෙහි මම විශ්වාස කරමි.
පව්කමාව සඳහා එක ම බව්තිස්මයක් ඇති බව මම විශ්වාස කරමි.
මළවුන්ගේ නැවත නැගිටීම ද මතු පැමිණෙන සදාතන ජීවිතය ද
මම බලාපොරොත්තු වෙමි. ආමෙන්.

19. නිසියානු විශ්වාස ලක්ෂණය වෙනුවට චතාරික කාලයෙත්, පාස්කු කාලයෙත්, රෝමානු කතෝලික සභාවේ බව්තිස්ම ලකුණ ලෙස සැලකෙන අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය උච්චාරණය කළ හැකිය.

අහස පොළොව මැවූ සර්වබලධාරි පිතාවන දෙවියන් වහන්සේ කෙරෙහි ද

උන් වහන්සේගේ ඒක පුත්‍රවූ අපගේ සමිඳාණන් වන

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ද මම විශ්වාස කරමි.

පහත සඳහන් වගන්තියේ 'කන්‍යා මරියයෝත්තමාවන්ගෙන් උපන්නාහ' යන්න දක්වා සියල්ලෝම හිස නමති.

උන් වහන්සේ ශුද්ධත්මයාණන් වහන්සේ විසින් ගැබවැස

කන්‍යා මරියයෝත්තමාවන්ගෙන් උපන්නාහ.

පොන්සියු පිලාත් හට යටහත්ව වද විඳ,

කුරුසියේ ඇණ ගැසුම් කා උකුත් වී, තැන්පත් කරන ලද්දාහ.

පාතාලවලට බැස, තුන් වැනිදා මළවුන් කෙරෙන් උත්ථාන කර වදාරා,

පරමණ්ඩලවලට නැගී සර්වබලධාරි දෙවි පියාණන් වහන්සේගේ

දකුණු පාර්ශ්වයෙහි වැඩ සිටින්නාහ.

එහි සිට ජීවතුන් සහ මළවුන් විනිශ්වය කරන්නට වඩින්නාහ.

ශුද්ධත්මයාණන් වහන්සේ කෙරෙහි ද

සාන්ත කතෝලික සභාව කෙරෙහි ද

සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභය කෙරෙහි ද

පාප ක්ෂමාව කෙරෙහි ද

මාංශ උත්ථානය කෙරෙහි ද අනන්ත ජීවිතය කෙරෙහි ද

මම විශ්වාස කරමි. ආමෙන්.

20. පසුව විශ්වාසකයන්ගේ යාච්ඤාව කියනු ලැබේ.

# ස්තෝත්‍ර යාගික පිළිවෙත

21. දේව වචනයේ පිළිවෙත නිම වූ පසු පඬුරු පෙරහැරේ ගීතිකාව ගයනු ලැබේ. සහයකයෝ ශ්‍රී දේහකඩ, මිදියුෂ පාත්‍රය සහ දිව්‍ය පූජා සංග්‍රහය පූජාසනය මත තබති.

22. දිව්‍ය පූජා යාගය සිදු කිරීම සඳහා අවශ්‍ය වන පූප හා මිදිරස ද සභාවේත් දිළිඳුන්ගේත්, අවශ්‍යතා සඳහා පුද කරනු ලබන වෙනත් පඬුරු ද වේ නම්, ඒවා ද පුදමින් මේ යාගයට සැදැහැවතුන්ගේ සහභාගිත්වය ප්‍රකාශ කිරීම මැනවි.

23. පූජාප්‍රසාදිතුමා පූජාසනය ළඟ සිට පූප සහිත තැටිය දෝතින් ගෙන එය මදක් ඉහළට ඔසවමින් පහත් හඬින් මෙසේ කියයි.

**සකල මැවිල්ලේ දෙවි සමිඳුණනි, අප ඔබ වහන්සේට පුදන මේ පූපය, ඔබ වහන්සේගේ ත්‍යාගශීලීත්වයෙන් අප ලැබූ හෙයින් ද පොළොවේ සරු සාරයෙන් සහ මනුෂ්‍යයන්ගේ ශ්‍රමයෙන් සැදුණු හෙයින් ද අප සඳහා ජීවන දායක පූපය බවට පත්වන හෙයින් ද ඔබ වහන්සේ ආශීර්වාදිත වන සේක්වා.**

ඉන් පසු තැටිය ශ්‍රී දේහකඩ මත තබනු ලැබේ. පඬුරු පිදීමේ ගීතිකාව නොගැයෙන විට, පෙර කී යැදුම උස් හඬින් කිව හැකි ය. එවිට සැදැහැවතුහු මෙසේ පිළිතුරු දෙති.

දෙවියන් වහන්සේ සදා ආශීර්වාදිත වන සේක්වා.

24. තේවාචාර්යවරයා හෝ පූජාප්‍රසාදිතුමා හෝ මිදියුෂ හා පැන් බිඳක් කුසලානය තුළට වත්කරමින්, පහත් හඬින්, මෙසේ කියයි.

**මේ පැන් සහ මිදි රසින් වන අභිරහස මගින් අපගේ මනුෂ්‍ය ස්වභාවයට සහභාගි වීමට තරම් බැහැපත් වූ ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයෙහි සහභාගි වීමට අපට ද හැකි වේවා.**

25. ඉන් පසු, පූජාප්‍රසාදිතුමා මිදියුෂ පාත්‍රය දෝතින් ගෙන මදක් ඔසවමින්, පහත් හඬින් මෙසේ කියයි.

**සකල මැවිල්ලේ දෙවි සමිඳුණනි, අප ඔබ වහන්සේට පුදන මේ මිදියුෂ, ඔබ වහන්සේගේ ත්‍යාගශීලීත්වයෙන් අප ලැබූ හෙයින් ද මිදි වැලේ පලදාවෙන් සහ මනුෂ්‍යයන්ගේ ශ්‍රමයෙන් සැදුණු හෙයින් ද අප සඳහා ආත්මික පානය බවට පත්වන හෙයින් ද ඔබ වහන්සේ සදා ආශීර්වාදිත වන සේක්වා.**

ඉන් පසු පූජාප්‍රසාදිතුමා කුසලානය ශ්‍රී දේහකඩ මත තබයි. පඬුරු පෙරහැරේ ගීතිකාව නොගැයෙන විට, පෙර කී යැදුම උස් හඬින් කිව හැකි ය. එවිට සැදැහැවත්හු මෙසේ පිළිතුරු දෙති.

දෙවියන් වහන්සේ සදා ආශීර්වාදිත වන සේක්වා.

26. ඉන් පසු පූජාප්‍රසාදිතුමා ගැඹුරින් හිස නමා, පහත් හඬින් මෙසේ කියයි.

**සමිඳුණනි, බැහැපත් කමින්ද පසුතැවුණු හදවතින් ද යුතුව සිටින අප, ඔබ වහන්සේ විසින් පිළිගනු ලැබේවා. දෙවි සමිඳුණනි, ඔබ වහන්සේ ඉදිරියේ අප පුදන මේ යාගය ඔබ වහන්සේට ප්‍රසන්න වේවා.**

27. අවස්ථාවට උචිත වේ නම් ශ්‍රී කුරුසියට ද පඬුරුවලට ද පූජාසනයට ද සුවඳ දුම් පුදනු ලැබේ. ඉන් පසු තේවාචාර්යවරයා හෝ වෙනත් තේවාධරයෙක් හෝ පූජාප්‍රසාදිතුමාටත්, සැදැහැවතුන්ටත් සුවඳ දුම් පුදයි.

28. ඉන් පසු පූජාප්‍රසාදිතුමා පූජාසනයේ පසෙක සිට අත් සෝදමින්, පහත් හඬින් මෙසේ කියයි.

**සමිඳුණනි, මාගේ දුර්ගුණ මා කෙරෙන් සෝදා හැරිය මැනව. මාගේ පාපයෙන් මා නිදොස් කළ මැනව.**

29. ඉන් පසු, පූජාප්‍රසාදිතුමා පූජාසනය මැද සිට, සැදැහැවත්හු දෙස බලා දෙ අත් දෙපසට විහිදා, යළි එක් කරමින් මෙසේ කියයි.

**සහෝදර සහෝදරියනි, මාගේ සහ ඔබගේ යාගය සර්වබලධාරී දෙවි පියාණන් වහන්සේට ප්‍රසන්න වන පිණිස යාච්ඤා කරන්න.**

සැදැහැවත්හු නැගිට මෙසේ පිළිතුරු දෙති.

තමන් වහන්සේගේ නාමයට ප්‍රශංසාවත් මහිමයත් අත්වනු සඳහා ද අපගේත් තමන් වහන්සේගේ මුළු ශුද්ධවූ සභාවෙත් යහපත සඳහා ද ඔබගේ හස්තවලින් සමිඳුණෝ මේ යාගය පිළිගන්නා සේක්වා.

30. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපසට විහිදා, පඬුරු මත යැදුම කියයි. එය අවසානයේ දී සැදැහැවත්හු මෙසේ පිළිතුරු දෙති.

ආමෙන්.

# ස්තෝත්‍ර යාගික යැදුම

31. පූජාප්‍රසාදිතුමා ස්තෝත්‍ර යාගික යැදුම අරඹමින් දෙ අත් විහිදා මෙසේ කියයි.

**සමිඳුණන් වහන්සේ ඔබ සමග වන සේක්වා.**

සැදැහැවතුනු පිළිතුරු දෙති.

**ඔබ සමග ද වන සේක්වා.**

පූජාප්‍රසාදිතුමා දෙ අත් ඉහළට ඔසවමින් මෙසේ කියයි.

**ඔබගේ හදවත් ඔසවන්න**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**සමිඳුණන් වහන්සේ වෙත ඔසවා සිටිමු.**

පූජාප්‍රසාදිතුමා දෙ අත් විහිදා මෙසේ කියයි.

**අපගේ දෙවිඳාණන් වන සමිඳුණන් වහන්සේට ස්තුති කරමු.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

**එය යෝග්‍ය හා යුතු වන්නේය.**

පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපසට විහිදා ප්‍රශංසා පෙරවදන ගායනා කරයි. පෙරවදන අවසානයේ දී පූජාප්‍රසාදිතුමා දෙ අත් වැඳගෙන, සැදැහැවතුන් සමග මෙසේ ගයමින් හෝ උස් හඬින් කියමින් යැදුම අවසන් කරයි.

**සුවිශුද්ධය, සුවිශුද්ධය, සුර සේනාවන්ගේ දෙවි සමිඳුණෝ සුවිශුද්ධ ය.**
**අහසත්, පොළොවත්, ඔබ වහන්සේගේ මහිමයෙන් පිරී තිබේ.**
**උත්කෘෂ්ට මණ්ඩලයෙහි හෝසන්නා.**
**සමිඳුණන් වහන්සේගේ නාමයෙන් වඩින උතුමාණෝ භාග්‍යවන්ත ය.**
**උත්කෘෂ්ට මණ්ඩලයෙහි හෝසන්නා.**

32. ස්තෝත්‍ර යාගික යැදුමේ ගයනු ලබන කොටස් (විශේෂයෙන් ප්‍රධාන කොටස්) සෑම දිව්‍ය පූජා පිළිවෙතක දී ම ගැයීමට පූජාප්‍රසාදිතුමාට අවසර ඇත. පළමු ස්තෝත්‍ර යාගික යැදුමේ හෙවත් රෝමානු පූජා නියමයේ වරහන් තුළ දක්වා ඇති කොටස් අත්හළ හැකි ය.

# ස්තෝත්‍ර යාගික යැදුම - II

96. මේ ස්තෝත්‍ර යාගික යැදුම සඳහා පහත සඳහන් ප්‍රශංසා පෙරවදන භාවිත කළ හැකි වුව ද ඒ වෙනුවට ගැලවීමේ අභිරහසට විශේෂයෙන් සම්බන්ධ වෙනත් පොදු ප්‍රශංසා පෙරවදන් ද භාවිත කළ හැකිය.

℣. සමිඳුණන් වහන්සේ ඔබ සමග වන සේක්වා.
℟. ඔබ සමග ද වන සේක්වා.
℣. ඔබගේ හදවත් ඔසවන්න
℟. සමිඳුණන් වහන්සේ වෙත ඔසවා සිටිමු.
℣. අපගේ දෙවිඳාණන් වන සමිඳුණන් වහන්සේට ස්තුති කරමු.
℟. එය යෝග්‍ය හා යුතු වන්නේය.

දෙවිමහෝත්තමයාණන් වහන්ස,
ඔබ වහන්සේගේ ප්‍රේමණීය පුත්‍රයාණන් වන,
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින්, සැම කල්හි ද සැම තැන්හි ද
අප ඔබ වහන්සේට තුති පිදීම සැබැවින් ම, යෝග්‍ය ය,
සාධාරණ ය. අපගේ යුතුකම හා ගැලවීම ය.

ඔබ වහන්සේ සියලු දේ මවා වදාළේ,
ඔබ වහන්සේගේ ශ්‍රී වචනයාණන් හේතුකොටගෙන ය.
ඔබ වහන්සේ අපගේ මිදුම්කරුවාණන් ද ගැලවුම්කරුවාණන් ද
වශයෙන් උන් වහන්සේ අප වෙත එවූ සේක.
උන් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන්,
මිනිස් බව ගෙන,
කන්‍යා මරියාවන්ගෙන් උපන් සේක.
ඔබ වහන්සේගේ කැමැත්ත ඉටු කරමින්,
උන් වහන්සේ කුරුසියෙහි දෙ අත් විහිදා,
අධික වේදනා විඳ, මරණයට පත් වී,
මරණයේ බැමි බිඳහැර, උත්ථානය විදහා දක්වමින්,
අප සැම පරිශුද්ධ ජනතාවක් වශයෙන්,
ඔබ වහන්සේට හිමි කර දුන් සේක.

එහෙයින්, සුරදූතයන් සහ සියලු ශුද්ධවන්තයන් ද සමග,
අපි ඔබ වහන්සේගේ මහිමය එක් හඬින් මෙසේ ප්‍රකාශ කරමු.

සුවිශුද්ධය, සුවිශුද්ධය, සුර සේනාවන්ගේ දෙවි සමිඳාණෝ සුවිශුද්ධ ය.
අහසත්, පොළොවත්, ඔබ වහන්සේගේ මහිමයෙන් පිරී තිබේ.
උත්කෘෂ්ට මණ්ඩලයෙහි හෝසන්නා.
සමිඳුණන් වහන්සේගේ නාමයෙන් වඩින උතුමාණෝ භාග්‍යවන්ත ය.
උත්කෘෂ්ට මණ්ඩලයෙහි හෝසන්නා.

97. පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපසට විහිදා මෙසේ කියයි.

**එසේය, සමිඳුණනි, ඔබ වහන්සේ සැබැවින් ම, සුවිශුද්ධ ය, සියලු සුවිශුද්ධතාවේ උල්පත ඔබ වහන්සේ ම ය.**

98. පූජාප්‍රසාදිතුමා දෙ අත් එක්කොට ඉන් පසු පඬුරු මත දිගුකොට මෙසේ කියයි.

**එහෙයින් අහසින් පිනි පතිත වන්නාක් මෙන්, ඔබ වහන්සේගේ ආත්මයාණන් මේ පඬුරු මත වස්වා, ඒවා පරිශුද්ධවත් කරන මෙන් අයැද සිටිමු.**

පූජාප්‍රසාදිතුමා දෙ අත් එක්කර ඉන් පසු මෙසේ කියමින් පූපය හා කුසලානය මත කුරුසිය ලකුණු කරයි.

**අප එසේ යදිනුයේ, මේ පඬුරු අප උදෙසා, අප සමිඳුණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයත් ✠ ශ්‍රී රුධිරයත් බවට පත්වනු සඳහා ය.**

දෙ අත් එක් කරයි.

99. පහත දැක්වෙන පාඨ සමඟ ඇති සමිඳාණන්ගේ වදන්, අර්ථවත් වන සේ නිරවුල් ව ද පැහැදිලිව ද උච්චාරණය කළ යුතුය.

**උන් වහන්සේ සිය කැමැත්තෙන් දුඃඛප්‍රාප්තියට තමන් පවරා දෙමින්,**

පූජාප්‍රසාදිතුමා පූපය දෝතින් ගෙන එය පූජාසනයෙන් මදක් ඉහළට ඔසවා මෙසේ කියයි.

**පූපය රැගෙන තුති පුදමින්, එය කඩා ස්වකීය ශ්‍රාවකයන්ට දෙමින්, මෙසේ වදාළ සේක.**

පූජාප්‍රසාදිතුමා මදක් නැමී මෙසේ කියයි.

**ඔබ සැම මෙයින් ගෙන අනුභව කරන්න,**
**මක්නිසාදයත්, මෙය ඔබ උදෙසා පවරා දෙනු ලබන මාගේ ශරීරයයි.**

පූජාප්‍රසාදිතුමා කැපකරන ලද ශ්‍රී පූපය සැදැහැවතුන් වෙත ඔසවයි. එය පළගනාව මත තබා, දණගසා නමස්කාර කරයි.

100. පූජාප්‍රසාදිතුමා ඉන් පසු මෙසේ කියයි.

එලෙසම රාත්‍රි භෝජනය අනුභව කළ පසු,

මිදි යුෂ කුසලානය දෑතින් ගෙන එය පූජාසනයට මදක් ඉහළින් ඔසවා මෙසේ කියයි.

උන් වහන්සේ කුසලානය ද රැගෙන, නැවත තුති පුදා, ස්වකීය ශ්‍රාවකයන්ට දෙමින්, මෙසේ වදාළ සේක.

පූජාප්‍රසාදිතුමා මදක් නැමී මෙසේ කියයි.

**ඔබ සැම මෙයින් ගෙන පානය කරන්න,**

**මක්නිසාදයත්, මෙය අභිනව වූ ද අනන්ත වූ ද ගිවිසුමේ,**

**මාගේ රුධිර කුසලානය යි.**

**පව් කමාව සඳහා ඔබ උදෙසා ද බොහෝ දෙනා උදෙසා ද**

**එය වගුරනු ලබන්නේ ය.**

**මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න.**

පූජාප්‍රසාදිතුමා ශ්‍රී රුධිර කුසලානය සැදැහැවතුන් වෙත ඔසවයි. එය ශ්‍රී දේහකඩ මත තබා, දණගසා නමස්කාර කරයි.

101. ඉන් පසු මෙසේ කියයි.

විශ්වාසයේ අභිරහස.

සැදැහැවත්හු උස් හඬින් පිළිතුරු දෙති.

සමිඳුණනි, ඔබ වහන්සේ නැවත වඩින තෙක්, ඔබ වහන්සේගේ ශ්‍රී මරණය ප්‍රකාශ කරමු. ඔබ වහන්සේගේ උත්ථානයට සාක්ෂි දරමු.

හෝ

මේ පූපය අනුභව කරන, මේ කුසලානෙන් පානය කරන සැමවිට ම, සමිඳුණනි, ඔබ වහන්සේ නැවත වඩින තෙක්, ඔබ වහන්සේගේ මරණය අපි ප්‍රකාශ කරමු.

හෝ

ඔබ වහන්සේගේ ශ්‍රී කුරුසියෙන් හා උත්ථානයෙන් අප මුදාගත් ලෝකයේ විමුක්තිදායකයාණනි, අප ගලවා ගත මැනව.

102. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් විහිදා, මෙසේ කියයි.

CC එහෙයින් සමිඳාණනි, උන් වහන්සේගේ මරණය ද උත්ථානය ද පරිස්මරණය කරමින්, ජීවනදායක පූපය ද ගැලැවුම්දායක කුසලානය ද අපි ඔබ වහන්සේට පුද කරමු. ඔබ වහන්සේ හමුවෙහි සිටිමින්, ඔබ වහන්සේට තේවා පුදකරන්නට සුදුස්සන් වශයෙන් සැලකීම ගැන, අපි ඔබ වහන්සේට තුති පුදමු. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයටත්, ශ්‍රී රුධිරයටත්, සහභාගි වන්නා වූ අප සැම, ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් එක්සත් කරනු ලබන ලෙස අවනතව අයැද සිටිමු.

C1 සමිඳාණනි, මුළු ලොවෙහි පැතිර පවත්නා, ඔබ වහන්සේගේ සාන්ත සභාව සිහි කළ මැනව.................. නමැති අප ශුද්ධෝත්තම පියාණන් ද .................. නමැති අපගේ රාජගුරුප්‍රසාදින් වහන්සේ ද (උන් වහන්සේගේ සහායක රාජගුරුප්‍රසාදින් වහන්සේ ද) සකල පූජක පිරිස ද සමග, එම සභාව දයාවෙන් පරිපූර්ණ වන්නට සලසනු මැනව.

මළවුන් සඳහා සිදු කරන පූජාවල දී මෙසේ ද කිව හැකි ය.

මෙලොවින් ඔබ වහන්සේ වෙත කැඳවා ගත්.................. නමැති ඔබ වහන්සේගේ (දාසයා/දාසිය/දාස දාසීන්) සිහි කළ මැනව. ඔබ වහන්සේගේ පුත්‍රයාණන්ගේ ශ්‍රී මරණයට සහභාගිවූ (ඔහුට/ඇයට/ඔවුන්ට), උන් වහන්සේ සමග උත්ථානයෙහි සහභාගි වීමට ද වරම් දුන මැනව.

C2 උත්ථානයේ අපේක්ෂාව තුළ, සැතපුණ අපගේ සහෝදර සහෝදරියන් ද ඔබ වහන්සේගේ දයානුකම්පාව කෙරෙහි විශ්වාසය ඇතිව නැසුණු අනිකුත් සියල්ලන් ද, සිහි කර, ඔබ වහන්සේගේ ශ්‍රී වත මඬලේ ආලෝකය වෙතට ඔවුන් පිළිගත මැනව.
අප සියල්ලන්ට දයානුකම්පා කළ මැනව. භාග්‍යවත් දේව මාතාවන් වන, කන්‍යාමරියෝත්තමාවන් ද ඕතුමියගේ ව්‍රතශුද්ධවත් පති වූ භාග්‍යවත් ජුසේ මුනිඳුන් ද භාග්‍යවත් අපෝස්තුළුවරුන්ද ශුද්ධවූ ජුසේවාස් මුනිඳුන් ද සැම කල්හි ම, ඔබ වහන්සේට ප්‍රශංසාව ගෙන දුන් සියලු ශුද්ධවන්තයන්ද සමග සදා ජීවිතයට සහභාගි වීමට අප සුදුස්සන් කළ මැනව. තවද, ඔවුන් හා සමග ඔබ වහන්සේට ප්‍රශංසා කිරීමට ද ඔබ වහන්සේගේ මහිමය වර්ණනා කිරීමට ද

දෙ අත් වැඳගනියි.

ඔබ වහන්සේගේ පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් අපට වරම් දුන මැනව.

103. ශ්‍රී ශරීරය සහිත පළගනාව ද ශ්‍රී රුධිර කුසලානය ද දූතට රැගෙන ඔසොවමින් මෙසේ කියයි:

**උන් වහන්සේ මගින් ද උන් වහන්සේ සමග ද උන් වහන්සේ කෙරෙහි ද සර්වබලධාරි දෙවි පියාණනි, ශුද්ධාත්මයාණන් වහන්සේ හා සමග එක් ව වැඩ වසන්නා වූ ඔබ වහන්සේට, සකල ගෞරවයත්, මහිමයත්, සදහට ම අත් වේවා.**

සැදැහැවත්හු උස්හඬින් පිළිතුරු දෙති.

ආමෙන්.

ඉන්පසු බොදුන් පිළිවෙත ඇරඹේ.

# ස්තෝත්‍ර යාගික යැදුම - III

104.

℣. සමිඳුණන් වහන්සේ ඔබ සමග වන සේක්වා.
℟. ඔබ සමග ද වන සේක්වා.
℣. ඔබගේ හදවත් ඔසවන්න
℟. සමිඳුණන් වහන්සේ වෙත ඔසවා සිටිමු.
℣. අපගේ දෙවිඳාණන් වන සමිඳුණන් වහන්සේට ස්තුති කරමු.
℟. එය යෝග්‍ය හා යුතු වන්නේය.

දේව වන්දනා රීතිවලට අනුව නියමිත ප්‍රශංසා පෙර වදන් මෙහිදී උච්චාරණය වේ.

සුවිශුද්ධය, සුවිශුද්ධය, සුර සේනාවන්ගේ දෙවි සමිඳුණෝ සුවිශුද්ධ ය.
අහසත්, පොළොවත්, ඔබ වහන්සේගේ මහිමයෙන් පිරී තිබේ.
උත්කෘෂ්ට මණ්ඩලයෙහි හෝසන්නා.
සමිඳුණන් වහන්සේගේ නාමයෙන් වඩින උතුමාණෝ භාග්‍යවන්ත ය.
උත්කෘෂ්ට මණ්ඩලයෙහි හෝසන්නා.

105. පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපසට විහිදා මෙසේ කියයි.

සමිඳුණනි, ඔබ වහන්සේ සැබැවින් ම, සුවිශුද්ධ ය. ඔබ වහන්සේගේ පුත්‍රයාණන් හා අපගේ සමිඳුණන් ද වන, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් හා ක්‍රියාකාරිත්වයෙන් ද ඔබ වහන්සේ මැවූ සියල්ල යුතු ලෙස ඔබ වහන්සේට ප්‍රශංසා කරයි. සියලු දෙයට ජීවනය දානය කර පරිශුද්ධවත් කරන ඔබ වහන්සේ හිරු උදාවේ සිට, හිරු බැස්ම දක්වා, ලොව පුරා සැමතැන ඔබ වහන්සේගේ නාමයට පිරිසිදු යාගයක් පුද කෙරෙන පිණිස, නිරන්තරයෙන්ම ඔබ වහන්සේ වෙතට ජනතාවක් රැස් කර ගන්නා සේක.

දෙ අත් එක්කොට පඬුරු මත විහිදා මෙසේ කියයිඃ

එහෙයින් සමිඳුණනි, ඔබ වහන්සේට පුදන්නට අප රැගෙන ආ මේ පුද පඬුරු එම ශුද්ධාත්මයාණන් වහන්සේ මගින්, පරිශුද්ධවත් කරන්නට කරුණා කරන මෙන් අවනතව අයැද සිටිමු.

106. ඉන් පසු දෙ අත් එක්කොට, මෙසේ කියමින් එක්වරක් පූපය සහ කුසලානයය මත කුරුසිය ලකුණු කරයිඃ

අප එසේ යදිනුයේ, උන් වහන්සේගේ නියමය අනුව සිදුකරන මේ අභිරහසේ පඬුරු, ඔබ වහන්සේගේ පුත්‍රයාණන් ද අපගේ සමිඳුණන් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයත් ✠ ශ්‍රී රුධිරයත් බවට පත්වනු සඳහා ය.

දෙ අත් වැඳ ගනියි.

107. පහත දැක්වෙන පාඨ සමඟ ඇති සම්දාණන්ගේ වදන්, අර්ථවත් වන සේ නිරවුල් ව ද පැහැදිලිව ද උච්චාරණය කළ යුතුය.

**තමන් වහන්සේ පාවා දෙනු ලැබූ රාත්‍රියේ,**

පූජාප්‍රසාදිතුමා පූපය දෝතින් ගෙන එය පූජාසනයෙන් මදක් ඉහළට ඔසවා මෙසේ කියයි.

**උන් වහන්සේ පූපය රැගෙන, ඔබ වහන්සේට ස්තුති කර ආශීර්වාදය පවසා එය කඩා, මෙසේ කියමින් ස්වකීය ශ්‍රාවකයනට දුන් සේක.**

පූජාප්‍රසාදිතුමා මදක් නැමී මෙසේ කියයි.

**ඔබ සැම මෙයින් ගෙන අනුභව කරන්න,**

**මක්නිසාදයත්, මෙය ඔබ උදෙසා පවරා දෙනු ලබන මාගේ ශරීරයයි.**

පූජාප්‍රසාදිතුමා කැපකරන ලද ශ්‍රී පූපය සැදැහැවතුන් වෙත ඔසවයි. එය පළගනාව මත තබා, දණගසා නමස්කාර කරයි.

108. පූජාප්‍රසාදිතුමා ඉන් පසු මෙසේ කියයි.

**එලෙසම රාත්‍රී භෝජනය අනුභව කළ පසු,**

මිදි යුෂ කුසලානය දෑතින් ගෙන එය පූජාසනයට මදක් ඉහළින් ඔසවා මෙසේ කියයි.

**උන් වහන්සේ එසේම කුසලානය ද රැගෙන, ඔබ වහන්සේට ස්තුති කර ආශීර්වාදය පවසා මෙසේ කියමින් ස්වකීය ශ්‍රාවකයනට දුන් සේක.**

පූජාප්‍රසාදිතුමා මදක් නැමී මෙසේ කියයි.

**ඔබ සැම මෙයින් ගෙන පානය කරන්න,**

**මක්නිසාදයත්, මෙය අභිනව වූ ද අනන්ත වූ ද ගිවිසුමේ,**

**මාගේ රුධිර කුසලානය යි.**

**පව් කමාව සඳහා ඔබ උදෙසා ද බොහෝ දෙනා උදෙසා ද**

**එය වගුරනු ලබන්නේ ය.**

**මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න.**

පූජාප්‍රසාදිතුමා ශ්‍රී රුධිර කුසලානය සැදැහැවතුන් වෙත ඔසවයි. එය ශ්‍රී දේහකඩ මත තබා, දණගසා නමස්කාර කරයි.

109. ඉන් පසු මෙසේ කියයි.

**විශ්වාසයේ අභිරහස**

සැදැහැවතුන් උස් හඬින් පිළිතුරු දෙති.

සමිඳාණනි, ඔබ වහන්සේ නැවත වඩින තෙක් ඔබ වහන්සේගේ ශ්‍රී මරණය ප්‍රකාශ කරමු. ඔබ වහන්සේගේ උත්ථානයට සාක්ෂි දරමු.

හෝ

මේ පූපය අනුභව කරන, මේ කුසලානෙන් පානය කරන සැමවිට ම, සමිඳාණනි, ඔබ වහන්සේ නැවත වඩින තෙක්, ඔබ වහන්සේගේ ශ්‍රී මරණය අපි ප්‍රකාශ කරමු.

හෝ

ඔබ වහන්සේගේ ශ්‍රී කුරුසියෙන් හා උත්ථානයෙන් අප මුදාගත් ලෝකයේ විමුක්තිදායකයාණනි, අප ගලවා ගත මැනව.

110. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපස විහිදා මෙසේ කියයි.

**CC** එහෙයින් සමිඳාණනි, ඔබ වහන්සේගේ එම පුත්‍රයාණන්ගේ ගැලවුම්දායක, දුක් සහිත මරණයත්, ආශ්චර්යවත් උත්ථානය සහ ස්වර්ගාරෝහණයත්, පරිස්මරණය කරමින් ද පුනරාගමනයේ දී උන් වහන්සේව පිළිගැනීමට සූදානම්ව සිටිමින් ද පරිශුද්ධවූත්, ජීවමානවූත්, මේ යාගය ස්තුති පූර්වකව, අපි ඔබ වහන්සේට පුද කරමු.
ඔබවහන්සේගේ සාන්ත සභාවේ යාගික පඬුර දෙස බලා වදාරණ මෙන් ඔබ වහන්සේගෙන් අයැද සිටිමු. තමන් වහන්සේගේ මරණය මගින් ඔබ වහන්සේ වෙත අප සමගි සන්ධානය කිරීමට ඔබ වහන්සේ අභිප්‍රාය කළ යාගික බිලිපඬුර වන තැනැන් වහන්සේ හඳුනාගෙන, ඔබ වහන්සේගේ පුත්‍රයාණන්ගේ ශ්‍රී ශරීරයෙන් සහ ශ්‍රී රුධිරයෙන් පෝෂණය වූ සහ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරුණු අප, ක්‍රිස්තු සමිඳාණන් තුළ එකම ශරීරයක් ද එකම ආත්මයක් ද වන්නට ඉඩ සැලසේවා යි අයදිමහ.

**C1** අප සඳහට ම ඔබ වහන්සේට ප්‍රසන්න බිලිපඬුරක් වීමට, උන් වහන්සේ සලසන සේක්වා. එවිට ඔබ වහන්සේ විසින් තෝරා ගන්නා ලද, විශ්වාසකයන් සමග, පළමුවෙන් දේව මාතාවන් වන අති භාග්‍යවත් කන්‍යාමරියෝත්තමාවන් ද ඕතුමියගේ ව්‍රතශුද්ධවත් පති වූ භාග්‍යවත් ජුසේ මුනිඳුන් ද භාග්‍යවත් අපෝස්තුළුවරුන්ද මහිමාන්විත ප්‍රාණ පරිත්‍යාගිවරුන් ද භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් ද (අද දින සමරන ශුද්ධ වූ ................ / ශුද්ධවන්තයාගේ / ශුද්ධවන්තියගේ හෝ දෙව් මැඳුර කැප කර ඇති ශුද්ධවන්තයාගේ / ශුද්ධවන්තියගේ නම ) (තුමන් ද / තුමිය ද ) සියලු ශුද්ධවන්තයන් ද සමග ඔවුන්ගේ උරුමයට හවුල් වන්නට අපි සුදුස්සන් වන්නෙමු. ඔබ වහන්සේ අබිමුවෙහි ඔවුන්ගේ යාච්ඤා මැදහත්කමේ නිරන්තර ආධාරය කෙරෙහි අපි විශ්වාසය තබමු.

C2 සමිඳාණනි, අප ඔබ වහන්සේ හා සමගි කළ මේ යාගය, සකල ලෝකයට සාමයත්, ගැලවීමත්, ප්‍රවර්ධනය කර දේවායි අයදිමු. ඔබ වහන්සේගේ දාසයා වන ................ නමැති අප ශුද්ධෝත්තම පියාණන් ද ............. නමැති අපගේ රාජගුරුප්‍රසාදින් වහන්සේ ද (උන් වහන්සේගේ සහායක රාජගුරුප්‍රසාදින් වහන්සේ ද) රදගුරු සමූහය ද සියලු පූජක තුමන් ද මිහිමත ඔබ වහන්සේ වෙත වන්දනා ගමනක යෙදෙන ඔබ වහන්සේම තමන් සතු කරගත් ඔබ වහන්සේගේ සාන්ත සභාව, විශ්වාසයෙහිත්, දයාවෙහිත්, ස්ථිර කරන්නට කරුණා කළ මැනව.

ඔබ වහන්සේ අබිමුවෙහි එක්රැස් කරගැනීමට අභිප්‍රාය කළ මේ පවුලේ යාච්ඤාවලට, දයාබරව සවන් දුන මැනව. එසේම කරුණාභරිත පියාණනි, සැම තැන විසිර සිටින ඔබ වහන්සේගේ සියලු දරුවන් දයානුකම්පා සහගතව ඔබ වහන්සේ වෙතට රැස්කර ගත මැනව.

C3 ✠ නැසී ගිය අපගේ සොහොයුරු සොහොයුරියන් ද ඔබ වහන්සේට ප්‍රසන්නව දිවි ගෙවා, මෙලොවින් වියෝ වූ සියල්ලන් ද ඔබ වහන්සේගේ රාජ්‍යයට කරුණාවෙන් කැඳවා ගත මැනව.

අපිද්, එම රාජ්‍යයට පැමිණ, ඔවුන් හා සමග සදහටම එම මහිමයේ පූර්ණත්වයෙන් තෘප්තිමත් වන්නට බලාපොරොත්තු වෙමු.✠

*දෙ අත් වැඳ ගනියි.*

යහපත් වූ සියල්ල ලොවට දානය කරන ඔබ වහන්සේ එය අපට ලැබෙන්නට සලස්වන්නේ අපගේ සමිඳාණන් වූ ක්‍රිස්තුන් වහන්සේ මගින් ම ය.

*ශ්‍රී ශරීරය සහිත පළඟනාව ද ශ්‍රී රුධිර කුසලානය ද දෑතට ගෙන ඔසොවමින් මෙසේ කියයි:*

111. උන් වහන්සේ මගින් ද උන් වහන්සේ සමග ද උන් වහන්සේ කෙරෙහි ද සර්වබලධාරි දෙවි පියාණනි, ශුද්ධාත්මයාණන් වහන්සේ හා සමග එක් ව වැඩ වසන්නා වූ ඔබ වහන්සේට, සකල ගෞරවයත්, මහිමයත්, සදහට ම අත් වේවා.

*සැදැහැවත්හු උස්හඬින් පිළිතුරු දෙති.*

ආමෙන්.

*ඉන්පසු බොදුන් පිළිවෙත ඇරඹේ.*

112. මේ ස්තෝත්‍ර යාගික යැදුම මළවුන් සඳහා දිව්‍ය පූජාවන්හි භාවිත කරන විට, මෙසේ ද කිව හැකි ය.

✠ (අද) මෙලොවින් ඔබ වහන්සේ කැඳවා ගත්, (නම) ................ නමැති ඔබ වහන්සේගේ (දාසයා/දාසිය/දාස දාසීන්) සිහි කළ මැනව. අපගේ දුබල ශරීර උන් වහන්සේගේ ප්‍රභාවත් ශ්‍රී ශරීරයට සමානව, මළවුන් උත්ථාන කරනු ලබන දවසෙහි දී, උන් වහන්සේ සමග, සදා ජීවිතය සඳහා නැවත නැගිටින්නට (ඔහුට ද/ඇයට ද/ ඔවුනට ද) සැලසුව මැනව. නැසීගිය අපගේ සොහොයුරු සොහොයුරියන් ද ඔබ වහන්සේට ප්‍රසන්නව දිවි ගෙවා, මෙලොවින් වියෝ වූ සියල්ලන් ද ඔබ වහන්සේගේ රාජ්‍යයට කරුණාවෙන් කැඳවා ගත මැනව.

අපිදු එම රාජ්‍යයට පැමිණ ඔවුන් හා සමග ඔබ වහන්සේගේ මහිමයෙන් සදාකල් තෘප්තිමත් වන්නට බලාපොරොත්තු වෙමු. එවිට අපගේ දෙනෙතින් සියලු කඳුළු පිස දමන අපගේ දෙවියන් වන ඔබ වහන්සේගේ සැබෑ ස්වභාවය දකිමින්, සැම කල්හි ඔබ වහන්සේට අනුරූප වී සදහටම ඔබ වහන්සේට ප්‍රශංසා කිරීමට අපට හැකි වන්නේ ය.

දෙ අත් වැඳගනියි.

අපගේ සමිඳුණන් වූ ක්‍රිස්තුන් වහන්සේ මගින් යහපත් වූ සියල්ල ලොවට දානය කරන්නේ ඔබ වහන්සේමය. ✠

# දිව බොදුන් පිළිවෙත

121. කුසලානය සහ තැටිය පුදසුන මත තබා, පූජාප්‍රසාදිතුමා දෙ අත් වැඳගෙන මෙසේ කියයි.

ගැලවුම්දායක අණ පණතින් ප්‍රගුණ වී, දේව උපදේශයෙන් පුහුණු වී, අපි එඩිතරව මෙසේ යාච්ඤා කරමු.

පූජාප්‍රසාදිතුමා දෙ අත් විහිදා සැදැහැවත්හු සමග මෙසේ යදී.

පරමණ්ඩලවල වැඩ සිටින, අපගේ පියාණනි ඔබ වහන්සේගේ ශ්‍රී නාමය ආරාධිත වේවා. ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා. ඔබ වහන්සේගේ කැමැත්ත පරමණ්ඩලයෙහි මෙන් මෙලොවෙහි ද ඉටු වේවා. අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව. අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන්, අපගේ වැරදි ද කමා කළ මැනව. පාප අවස්ථාවලට අසුවීමට අපට ඉඩ නොදී, අයහපතින් අප මුදා ගත මැනව.

122. පූජාප්‍රසාදිතුමා පමණක් දෙ අත් විහිදා මෙසේ කියයි.

සමිඳාණනි, සියලු අයහපතින් අප මුදාගන්නා මෙන් ද අපගේ මේ ජීවිත කාලයෙහි දී අපට සාමය දෙන මෙන් ද අපි අවනතව අයැද සිටිමු. එවිට ඔබ වහන්සේගේ කරුණාබර පිහිට ලැබ, නිරතුරුම පවින් මිදී, සියලු කරදරයෙන් සුරක්ෂිත වී, අපගේ ගැලවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නැවත පැමිණීමේ භාග්‍යවත් අපේක්ෂාවෙන් අපි වෙසෙන්නෙමු.

පූජාප්‍රසාදිතුමා දෙ අත් වැඳ ගනියි. සැදැහැවත්හු යාච්ඤාව අවසානයේ දී මෙසේ පිළිතුරු දෙති.

මක්නිසාදයත්, රාජ්‍යය ද බලය ද මහිමය ද සදහට ම ඔබ වහන්සේගේ ය.

123. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් විහිදා පැහැදිලි හඬින් මෙසේ කියයි.

"සාමය ඔබ සමග තබා යමි. මාගේ සාමය ඔබට දෙමි"යි ස්වකීය ශ්‍රාවකයන් අමතා වදාළ ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණනි, ඔබ වහන්සේ අපගේ පාපයන් නොතකා, ඔබ වහන්සේගේ සභාවේ විශ්වාසය සලකා, ඔබ වහන්සේගේ කැමැත්ත පරිදි, එම සභාවට දයාන්විතව සාමයද, සමගිය ද දානය කළ මැනව.

දෙ අත් වැඳ ගනියි.

ඔබ වහන්සේ සදහට ම, වැඩ වසන සේක. රජකම් කරන සේක.

සැදැහැවත්හු පිළිතුරු දෙති.

ආමෙන්.

124. පූජාප්‍රසාදිතුමා සැදැහැවත්හු දෙස බලා දෙ අත් විහිදා, ඉන් පසු දෙ අත් එක් කරමින් මෙසේ කියයි.

සමිඳාණන් වහන්සේගේ සාමය ඔබ සමග නිතර ම පවතීවා.

සැදැහැවත්හු පිළිතුරු දෙති.

ඔබ සමග ද වන සේක්වා.

125. ඉන් පසු තේවාචාර්යතුමා හෝ පූජාප්‍රසාදිතුමා හෝ අවස්ථානුකූල ව මෙසේ කියයි.

අපි එකිනෙකාට සාමය පතමු.

එවිට සියල්ලෝ දේශීය සිරිතට අනුකූලව සාමය පතති.

පූජාප්‍රසාදිතුමා තේවාධරයාට හෝ සහායකයාට සාමය පතයි.

126. ඉන් පසු, පූජාප්‍රසාදිතුමා පූපය රැගෙන තැටිය මත එය දෙකට කඩා, එයින් කුඩා කොටසක් කුසලානයයට මුසු කරමින්, පහත් හඬින් මෙසේ කියයි.

**අප සමිඳාණන් වහන්සේවන, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයේත්, ශ්‍රී රුධිරයේත් සම්මිශ්‍රණය, එය ලබා ගන්නා වූ අපගේ සදා ජීවනය පිණිස වේවා.**

127. මේ අතර, පහත දක්වන පදය උච්චාරණය කරනු හෝ ගයනු ලැබේ.

ලොවේ පව් හරන, දේව බැටළුපෝතකයාණනි,
අපට කරුණා කළ මැනව.
ලොවේ පව් හරන, දේව බැටළුපෝතකයාණනි,
අපට කරුණා කළ මැනව.
ලොවේ පව් හරන, දේව බැටළුපෝතකයාණනි,
අපට සාමය දුන මැනව.

ශ්‍රී පූප කැඩීමට වැඩිපුර වෙලාවක් ගත වන්නේ නම්, පළමු පදය කිහිප වරක් ගායනය හෝ උච්චාරණය කළ හැකිය. අන්තිම පදයෙන් (අපට සාමය දුන මැනව) නිමකළ යුතුය.

128. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් වැඳ, පහත් හඬින් මෙසේ කියයි.

ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණනි, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණනි, පියාණන් වහන්සේගේ කැමැත්තෙන් ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහයෝගයෙන් ද ඔබ වහන්සේගේ මරණය මගින්, ඔබ වහන්සේ ලෝකය ජීවමාන කළ සේක. ඔබ වහන්සේගේ මේ ශ්‍රී ශරීරයේ සහ ශ්‍රී රුධිරයේ ආනුභාවයෙන්, මාගේ සියලු පව්වලින් ද සැම අයහපතින් ද මා මුදා ගත මැනව. ඔබ වහන්සේගේ අණපණත්හී මා නිතර නියැලී සිටින්නට සලසනු මැනව. කිසි දිනක, මට ඔබ වහන්සේගෙන් වෙන් වන්නට ඉඩ නුදුන මැනව.

නැතහොත් මෙසේ ද කිව හැකි ය.

ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණනි, ඔබ වහන්සේගේ ශ්‍රී ශරීරයත්, ශ්‍රී රුධිරයත් ලබා ගැනීම මා විනිශ්චය කරනු ලැබීමටත්, වරදකරුවකු කරනු ලැබීමටත් හේතුවක් නො වේවා. මට දක්වන ඔබ වහන්සේගේ යහපත්කමින් මාගේ සිතට සහ කයට ආරක්ෂාවක් ද සුවදායක ඖෂධයක් ද වේවා.

129. පූජාප්‍රසාදිතුමා දණ නමස්කාර කර, ශ්‍රී පූපය අතට ගෙන එය තැටියට හෝ ශ්‍රී රුධිර කුසලානයට මදක් ඉහළින් තබා සැදැහැවතුන්ට පෙන්වමින්, පැහැදිලි හඬකින් මෙසේ කියයි

මෙන්න දේව බැටළුපෝතකයාණෝ, මෙන්න ලොවේ පව් හරන තැනැන් වහන්සේ, උන් වහන්සේගේ භෝජනයට ආරාධනා ලද්දෝ භාග්‍යවන්තයෝ ය.

සැදැහැවත්හු පූජාප්‍රසාදිතුමා හා එක්ව මෙසේ කියති.

**සමිඳාණනි, ඔබ වහන්සේ මා තුළ ට වඩින්නට මම සුදුස්සෙක් නොවෙමි. එහෙත්, වචනයක් පමණක් වදාළ මැනව. එවිට මාගේ ආත්මය සුව වන්නේ ය.**

130. පූජාප්‍රසාදිතුමා පූජාසනය වෙත නැමී පහත් හඬින් මෙසේ කියයි.

**ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය, සදා ජීවනය දක්වා මා රැකගනිත් වා.**

ඉන් පසු පූජාප්‍රසාදිතුමා ගෞරවපූර්වක බැතියෙන්, ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය අනුභව කරයි.

ඉන් පසු ශ්‍රී රුධිර කුසලානයද රැගෙන පහත් හඬින් මෙසේ කියයි.

**ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී රුධිරය, සදා ජීවනය දක්වා මා රැකගනිත් වා.**

පූජාප්‍රසාදිතුමා ගෞරවපූර්වක බැතියෙන් ශ්‍රී රුධිරය පානය කරයි.

131. ඉන් පසු තැටිය හෝ පූප බඳුන හෝ රැගෙන සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සිටින සැදැහැවත්හු වෙත ගොස්, ඔවුන් එකිනෙකාට ශ්‍රී පූපය පෙන්වමින් මෙසේ කියයි.

**ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය.**

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන්නා මෙසේ පිළිතුරු දෙයි.

**ආමෙන්.**

තේවාචාර්යවරු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කරන විටද ඉහත කී ආකාරයෙන් සිදු කරති.

132. දෙයාකාරයෙන් ම, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කරනු ලබන විට, ඊට අදාළ පිළිවෙත අනුගමනය කළ යුතු ය.

133. පූජාප්‍රසාදිතුමා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කරන අතර, දිව බොදුන් ගීතිකා ගයනු ලැබේ.

134. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය හමාර වූ විට, පූජාප්‍රසාදිතුමා හෝ තේවාචාර්යවරයා හෝ තේවාසහයකයා හෝ තැටිය කුසලානයට ඉහලින් අල්ලා පිරිසිදු කරයි. එසේම කුසලානය ද පිරිසිදු කරයි. එසේ කරමින් පූජාප්‍රසාදිතුමා පහත් හඬින් මෙසේ කියයි.

**සමිඳාණනි, අප අනුභව කළ මේ භෝජනය අප හදවත් තුළ පිරිසිදු සිතකින් රඳවා ගැනීමට හැකි වේවා. කාලීණව අප ලද මේ තිළිනය අපට සදාතන ඖෂධයක් වේවා.**

135. ඉන් පසු පූජාප්‍රසාදිතුමාට අසුන් ගත හැකි ය. අවස්ථානුකූලව, සුළු කාලයක් භාවනාත්මක නිශ්ශබ්දතාවකින් යාච්ඤා කරමින් හෝ තෙහෙළි ගීතිකාවක් හෝ වෙනත් ප්‍රශංසා ගීතිකාවක් ගයමින් හෝ ගත කළ හැකි ය.

136. ඉන් පසු පූජාප්‍රසාදිතුමා සිය අසුන ළඟ හෝ පූජාසනය ළඟ හෝ සිටගෙන දෙ අත් වැඳ, සැදැහැවත්හු දෙස බලා මෙසේ කියයි.

**අපි යාච්ඤා කරමු.**

නිශ්ශබ්දව යාච්ඤා කිරීම පෙර සිදු නොවීනම්, මෙහිදී සුළු මොහොතක් සියල්ලෝ නිශ්ශබ්දව යාච්ඤා කරති. ඉන් පසු පූජාප්‍රසාදිතුමා දෙ අත් දෙපස විහිදා බොදුනෙන් පසු යැදුම කියයි.

සැදැවත්හු එය අවසානයේ දී මෙසේ පිළිතුරු දෙති.

**ආමෙන්.**

# සමාප්ත පිළිවෙත

137. අත්‍යවශ්‍ය කෙටි දැන්වීම් තිබේ නම් මෙතැන දී ප්‍රකාශ කළ හැකි ය.

138. ඉන් පසු සැදැහැවත්හු පිටත් කර හැරීම සඳහා, පියතුමා සැදැහැවත්හු දෙස බලා දෙ අත් විහිදා මෙසේ කියයි.

**සමිඳාණන් වහන්සේ ඔබ සමග වන සේක්වා.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

ඔබ සමග ද වන සේක්වා.

පූජාප්‍රසාදිතුමා මෙසේ කියමින් සැදැවතුන් ආශිර්වාද කරයි.

**සර්වබලධාරි දෙවි මහෝත්තමයාණන් වන පියාණන් වහන්සේ ද පුත්‍රයාණන් වහන්සේ ද ✠ ශුද්ධාත්මයාණන් වහන්සේ ද ඔබ ආශිර්වාද කරන සේක්වා.**

ඉන් පසු සැදැහැවත්හු මෙසේ පිළිතුරු දෙති

ආමෙන්

139. සමහර දිනවලදී ද ඇතැම් අවස්ථාවල ද විශේෂ ආශීර්වාද කිරීමක් හෝ සැදැහැවත්හු මත අයැදීමක් හෝ කළ හැකි ය. එවැන්නක් ඇත්නම් එය දැන්වීම් කියවා නිමවූ විගස කළ යුතුය.

---

140. රාජගුරු ප්‍රසාදින් වහන්සේ පවත්වන දිව්‍ය පූජා යාගයේදී, එතුමන් මකුටය පැළඳ දෙ අත් විහිදා මෙසේ පවසයි.

**සමිඳාණන් වහන්සේ ඔබ සමග වන සේක්වා.**

සැදැහැවත්හු පිළිතුරු දෙති.

ඔබ සමගද වන සෙක්වා.

රජගුරු ප්‍රසාදින් වහන්සේ මෙසේ පවසයි.

**සමිඳාණන් වහන්සේගේ නාමය ආරාධිත වේවා.**

සැදැහැවත්හු පිළිතුරු දෙති

දැනුත් නිතිපතත් එසේම වේවා.

රජගුරු ප්‍රසාදින් වහන්සේ මෙසේ පවසයි.

**අපගේ ආධාරය සමිඳාණන් වහන්සේගේ නාමයෙහි ය.**

සැදැහැවත්හු පිළිතුරු දෙති

උන් වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක.

රජගුරු ප්‍රසාදින් වහන්සේ මෙසේ පවසයි.

**සර්වබලධාරි දෙවි මහෝත්තමයාණන් වන ✠ පියාණන් වහන්සේ ද ✠ පුත්‍රයාණන් වහන්සේ ද ✠ ශුද්ධාත්මයාණන් වහන්සේ ද ඔබ ආශීර්වාද කරන සේක්වා.**

141. ඉන් පසු තේවාචාර්ය හෝ පූජාප්‍රසාදිතුමා හෝ දෙ අත් වැඳ සැදැහැවත්හු දෙස බලා මෙසේ කියයි.

**දිව්‍ය පූජාව අවසානයි. සුබාරංචිය රැගෙන යන්න.**

හෝ

**යන්න, සමිඳාණන් වහන්සේගේ සුබාරංචිය ප්‍රකාශ කරන්න.**

හෝ

**සාමයෙන් යන්න. ඔබගේ ජීවිතයෙන් සමිඳාණන් වහන්සේ මහිමයට පත් කරන්න.**

හෝ

**යන්න, සාමය රැගෙන යන්න.**

සැදැහැවත්හු පිළිතුරු දෙති

**දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.**

142. පූජාප්‍රසාදිතුමා පූජාරම්භයේ දී මෙන් පූජාසනය සිපාචාර කරයි. ඉන් පසු නියමිත නමස්කාරය කර තේවාධරයන් සමග නික්ම යයි.

143. දේවවන්දනා ක්‍රමයේ තවත් පිළිවෙත් දිව්‍ය පූජාව අවසාන වූ විගස ම සිදු කෙරේ නම් සමාප්ත පිළිවෙත නොපැවැත්වේ.